ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

## පණිවුඩය

අප රජය බලයට පත්වූයේ යහපාලනය රට තුළ ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය සියලු දේශපාලන, සමාජ සහ නීතිමය ප්‍රතිසංස්කරණ ඉටුකරන බවට පොරොන්දු වෙමිනි. දහ නව වන ව්‍යවස්ථා සංශෝධනය සම්මත කිරීමත් සමග බලාත්මක වූ ස්වාධීන කොමිෂන් සභා විසින් එම ප්‍රතිසංස්කරණ සඳහා වන මූලික දොරටුව විවෘත කෙරුණු බව සියලු දෙනා අවිවාදයෙන් පිළිගන්නා කරුණකි. එසේ ස්ථාපනය කෙරුණු ස්වාධීන රාජ්‍ය සේවා කොමිසම දේශපාලන ඇඟිලි ගැසීම් වලින් තොරව රාජකාරි කිරීම සඳහා ශක්තිමත් ව්‍යුහයක් රාජ්‍ය සේවකයාට සපයා ඇත.

එහෙත් කිසිදු පරිපාලන ව්‍යුහයකට නීති, රෙගුලාසි ස්වාභාවික යුක්තිය හෝ සාධාරණත්වය උල්ලංඝනය කළ හැකි බව එයින් අදහස් නොකෙරේ. පරිපාලනය පැවරී ඇති රාජ්‍ය ආයතන වෙතින් පුරවැසියෙකුට යම් අයුක්තියක් හෝ අගතියක් සිදුවී තිබේනම් එකී අයුක්තියට හේතු සෙවීම විමර්ශනය කිරීම, සහනයක් ලබාදීම හා එය නිවැරදි කිරීමට බලතල සහිත ආයතනයක් පැවතිය යුතුය.

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් ආයතනය හෙවත් ඔම්බුඩ්ස්මන් කාර්යාලය ස්ථාපනය කෙරුණේ මේ අවශ්‍යතාවය සපුරාලමිනි. එහෙත් එවැනි ආයතනයක් පැවතීමෙන් පමණක් සාමාන්‍ය ජනතාව ඒ වෙත විශ්වාසය තබා පැමිණෙනු ඇතැයි අපේක්ෂා කළ නොහැකිය.

සමාජයේ අවවරප්‍රසාදිත ජනතාව වෙත වඩාත් සමීප වෙමින්, රාජ්‍ය සේවය සම්බන්ධයෙන් ඔවුන්ගේ යම් පැමිණිලි ඇතොත් ඒවා ඉදිරිපත් කිරීම සඳහාත්, සාධාරණ විසඳුමක් ලබා ගැනීමට ඇති අයිතිය සම්බන්ධයෙන් ඔවුන් දැනුවත් කොට ධෛර්යමත් කරවීමත් රජයේ වගකීමක් වන්නේ, යහපාලනය පුරවැසි අයිතියක් බවට පත් කිරීම රජයේ වගකීමක් බැවිනි.

එම අරමුණින් දියත් කෙරෙන නව වැඩසටහනට අනුව සැකසෙන මෙම වෙබ් අඩවිය, පොදු ජනතාව තම හිමිකම් සහ වරප්‍රසාද පිළිබඳ දැනුම්වත් කෙරෙන ශක්තිමත් පියවරක් වනු ඇතැයි අපේක්ෂා කරමි.

මෛත්‍රීපාල සිරිසේන

2016 සැප්තැම්බර් මස 29 වන දින

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு
Democratic Socialist Republic of Sri Lanka